Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

### විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය

### ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
### මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය - ඔරුගොඩවත්ත
### පූර්ණ කාලීන පාඨමාලාවන් සඳහා ආධුනිකයින් බඳවා ගැනීම
(සතියේ දින දිවා කාලීන කණ්ඩායම සහ සතියේ දින සන්ධ්‍යාකාලීන සහ සතිඅන්ත කණ්ඩායම)

ජපන් - ශ්‍රී ලංකා මිත්‍රත්වය මත ප්‍රදානය වූ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ පවත්වනු ලබන පහත සඳහන් පූර්ණ කාලීන පාඨමාලා සඳහා ආධුනිකයින් බඳවා ගැනීම පිණිස වයස අවුරුදු 16 ට නොඅඩු 25 ට නොවැඩි ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. අයදුම්පත් කැඳවනු ලබන පාඨමාලා

| *අනු. අංක* | *පාඨමාලා* | *ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ )* | *කාල සීමාව* |
|---|---|---|---|
| අංක 1, 2, 3, 4 සඳහන් පාඨමාලා සඳහා අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයෙන් සිංහල, ගණිතය සහ විද්‍යාව ඇතුළුව දෙවතාවකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම. | | | |
| 1 | මෝටර් රථ කාර්මික ශිල්පී - Automobile Mechanic<br>(Introduction of Basic measuring instruments, Repair and Maintenance of engine systems and chassy systems, Testing of vehicle wheel alignment, Vehicle systems diagnostic by using Analyzers and scanners, Technical English and Basic Computer Literacy) | 4 වන මට්ටම | අවු. 03 |
| 2 | මෝටර් රථ කාර්මික ශිල්පී - Automobile Electrician<br>(Introduction of Basic Electricity, Basic Electrical circuits, Using of Electrical Measuring instruments, Basic Electronic Technology, Repairing of all electrical and electronic systems related to automotives and Automobile Audio/Video and Car Phone systems.) | 4 වන මට්ටම | අවු. 03 |
| 3 | යන්ත්‍ර ශිල්පී - Machinist<br>(සී එන් සී (CNC) ප්‍රෝගෑමින්, කැම් (CAM) ප්‍රෝගෑමින්, ලේත් මැෂිනින් ඇතුලු මූලික යන්ත්‍රවලට අමතරව මෝටර් රථ ඉංජිනේරු ක්ෂේත්‍රයට අයත් හෙඩ් ෆේසින්, බෝරිං හෝනින්, ක්‍රෑන්ක් ග්‍රයින්ඩ් සහ ටූල් කටර් ග්‍රයින්ඩින් යන සියලුම යන්ත්‍රවල පුහුණුව ලබාදේ. | 4 වන මට්ටම | අවු. 03 |
| 4 | මෝටර් රථ වායු සමීකරණ කාර්මික ශිල්පී - Automobile A/C Mechanic<br>(Introduction of Safety (Environmental and Personal), Basic Workshop Practice, Fundamentals of Air Conditioning systems, Dismantiling and Assembling of related A/C components, Introduction of A/C Electrical | 4 වන මට්ටම | අවු. 02 |

| අනු. අංක | පාඨමාලා | ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ ) | කාල සීමාව |
|---|---|---|---|
| | circuits and trouble shooting of Electrical circuits, Using of related modern equipment, Gas welding and Brazing, Computer Based Training for understanding/reading, CDs, manuals, flow charts and preparation of estimations) | 4 වන මට්ටම | අවු. 02 |
| අංක 05 පාඨමාලාව සඳහා රජයේ හෝ රජය විසින් පිළිගන්නා ලද පාසලක 8 වන ශ්‍රේණිය සමත්වී තිබීම. | | | |
| 5 | මෝටර් රථ ටින්කර් සහ පින්තාරු ශිල්පී - Automobile Tinker and Painter<br><br>(Basic workshop practice, Gas Welding, Arc Welding, Mig/Mag Welding, Tig Welding, Introduction of Painting Materials, Identification of Body Damages and Preparation of damaged body surfaces, Mixing of colours, preparation of estimation, Technical English and Introduction of Computer Literacy.) | 4 වන මට්ටම | අවු. 03 |
| අංක 1, 2, 3, 5 සඳහන් පාඨමාලා සඳහා පාඨමාලාවල පළමු වසරේ ආයතනික පුහුණුවේ දී ලබාගත් න්‍යායික සහ ප්‍රායෝගික දනුම සහ කුසලතාවය වර්ධනය කර ගැනීම සඳහා පාඨමාලාවේ දෙවන හා තුන්වන වසර කර්මාන්ත පුහුණුව සඳහා රජයට අනුබද්ධ හා නොවන මෝටර් රථ ක්ෂේත්‍රයේ කර්මාන්තශාලාවලට අනුයුක්ත කරනු ලැබේ.<br><br>අංක 4 සඳහන් පාඨමාලාව සඳහා පුහුණුවේ පළමු වසර ආයතනය තුළදී න්‍යායික සහ ප්‍රායෝගික පුහුණුව ලබාදෙන අතර ඉතිරි වසර කර්මාන්ත පුහුණුව සඳහා රජයට අනුබද්ධ හා නොවන මෝටර් රථ ක්ෂේත්‍රයේ කර්මාන්තශාලාවලට අනුයුක්ත කරනු ලැබේ. | | | |

2. **වයස :**

2018.10.01 වැනි දිනට වයස අවුරුදු 16ට නොඅඩු සහ 25ට නොවැඩි ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශ්වයටම අයදුම්කල හැක.

3. **පාඨමාලාවන් පවත්වනු ලබන වේලාවන් :**

*අංක 1, 2, 3, 4, සහ 5 සඳහන් පූර්ණ කාලීන පාඨමාලා සතියේ දින දිවා කාලයේ පැවැත්වේ.*

- සතියේ දින දිවා කාලය පූර්ණ කාලීන පාඨමාලා - පෙ. ව. 8.00 සිට ප. ව. 3.45 දක්වා

*අංක 1, 2, සහ 5 සඳහන් පූර්ණ කාලීන පාඨමාලා සතියේ දින සන්ධ්‍යාකාල සහ සතිඅන්තයේදී පැවැත්වේ.*

- සතියේ දින සන්ධ්‍යාකාල - ප. ව. 4.00 සිට ප. ව. 7.00 දක්වා
- සතිඅන්තයේ - සෙනසුරාද සහ ඉරිදා දිනයන්හි පෙ. ව. 8.00 සිට ප. ව. 5.00 දක්වා

4. **සහතිකපත් ප්‍රදනය :**
සාර්ථක ලෙස පුහුණුව අවසන් කර ජාතික වෘත්තීය සුදුසුකම් අවසාන ඇගයීම් පරීක්ෂණයෙන් සමත්වන ආධුනිකයින්ට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ජාත්‍යන්තරව පිළිගත් ''ජාතික වෘත්තීය සුදුසුකම් 4 වන මට්ටමේ සහතිකය'' සමග මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ සහතිකයද ප්‍රදානය කරනු ලබයි.

5. **පාඨමාලා සඳහා තෝරා ගැනීම :**
බඳවා ගැනීමේ අධ්‍යාපන සුදුසුකම් සපුරාලන සියලුම අයදුම්කරුවන් පැය 01ක අභියෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටිය යුතු අතර ඉන් ලබාගත් ලකුණුවල ප්‍රමුඛතාවය අනුව සම්මුඛ පරීක්‍ෂණයට කැඳවා තෝරා ගැනීම සිදුකරනු ලබයි.

6. **අයදුම්පත් එවිය යුතු ආකාරය :**
මි. මී. 290 x මි. මී. 210 (A4) ප්‍රමාණයේ කඩදාසියක පහත සඳහන් උපදෙස් හා ආකෘතිය අනුව පිළියෙල කරගත් අයදුම්පත, රු. 45 මුද්දරයක් ඇලවූ සහ ඔබගේ ලිපිනය සඳහන් දිග ලියුම් කවරයක් සමග මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ දෙමටගොඩ මහජන බැංකු ශාඛාවේ ගිණුම් අංක 071100103320674 දරන ගිණුමට විභාග ගාස්තු ලෙස රු. 300.00 ක් බැර කර ලබාගත් ලදුපත එම අයදුම්පතේ පසු පිටෙහි නොගැලවෙන සේ අලවා 2018 ඔක්තෝබර් මස 01 දිනට හෝ ඊට ප්‍රථම අධ්‍යක්ෂ/විදුහල්පති, මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය, අංක 69/ඒ, බේස්ලයින් මාවත, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය යන ලිපිනයට <u>ලියාපදිංචි තැපෑලෙන්</u> එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ උඩ වම් කෙලවරේ ''ආධුනිකයින් බඳවා ගැනීම'' යනුවෙන් සඳහන් කළ යුතුය. අප ආයතනයට පැමිණද ඉල්ලුම්පත් නොමිලේ ලබාගත හැක. නැතහොත් අපගේ www. aeti.edu.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

අයදුම්පත සම්පූර්ණ කිරීමට උපදෙස් :

- අයදුම්කරුගේ අභිමතය පරිදි, ප්‍රමුඛතාවය ලබාදෙමින් පාඨමාලා තුනක් අයදුම්පතේ 10 වන ඡේදයේ සඳහන් කර අයදුම්කල හැකිය.
- ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ දැනට පුහුණුව ලබමින් සිටින අයට අයදුම් කළ නොහැක.
- තැපෑලේදී අස්ථානගතවන හෝ ප්‍රමාදවන අයදුම්පත්වලට මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය වග නොකියන අතර සම්පූර්ණ කරන ලද අයදුම්පත් කල් ඇතිව එවන මෙන් දන්වා සිටිනු ලැබේ.
- වැඩිදුර තොරතුරු සඳහා ලේඛකාධිකාරී, දුරකථන අංක - 011-2572977 හෝ 011-2532182 විමසන්න.

වෛද්‍ය සාරංග අලහප්පෙරුම,
සභාපති,
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය,
අංක 971 ශ්‍රී විජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

**ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය**
මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය
***ආධුනිකයින් බඳවා ගැනීමේ අයදුම්පත***

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

| |
|---|
| |

01. මුලකුරු සමඟ නම :

02.

| ස්ත්‍රී | පුරුෂ |
|---|---|
| | |

03. සම්පූර්ණ නම :

| 04. උපන්දිනය : | වර්ෂය | මාසය | දිනය |
|---|---|---|---|
| | | | |

05. ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

06. ලිපිනය :

දුරකථන අංකය : ජංගම :
ස්ථාවර :

ඊමේල් ලිපිනය :

07. පරිපාලන දිස්ත්‍රික්කය :

ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාසය :

08. අධ්‍යාපන සුදුසුකම් : (ලබා ඇති උසස්ම සුදුසුකම් x ලකුණ යොදන්න.)

| | | | | | |
|---|---|---|---|---|---|
| 8 වන ශ්‍රේණිය | | අ. පො. ස. (සා. පෙළ) | | අ. පො. ස. (උ.පෙළ) | |

09. අ. පො. ස. (සා.පෙළ.) විභාග ප්‍රතිඵල :

| | සමත්වූ විෂයයන් | සාමාර්ථය | වර්ෂය | | සමත් වූ විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|---|---|---|---|
| 1 | | | | 8 | | | |
| 2 | | | | 9 | | | |
| 3 | | | | 10 | | | |
| 4 | | | | 11 | | | |
| 5 | | | | 12 | | | |
| 6 | | | | 13 | | | |
| 7 | | | | 14 | | | |

අ. පො. ස. (උ.පෙළ.) විභාග ප්‍රතිඵල :

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | | | | 3 | | | |
| 2 | | | | 4 | | | |

10. තෝරා ගනු ලබන පාඨමාලාවන් පිළිවෙලින් :

| |
|---|
| 1 |
| 2 |
| 3 |

ඉහත සඳහන් කරුණු නිවැරදි බවත්, සත්‍ය බවත් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ දැනට පුහුණුවක් මා නොලබන බවත්, මෙයින් සහතික කරන අතර, මෙහි දක්වා ඇති කරුණු අසත්‍ය බවට අනාවරණය වුවහොත්, මම මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ පාඨමාලාව හැදෑරීම සඳහා නුසුදුස්සෙකු වන බවත් හොඳාකාරව දනිමි.

________,
අයදුම්කරුගේ අත්සන.

දිනය :________.